මල් කැකුළු Sri Lankan Kids

නුවණ - දැනුම - විනෝදය

WISDOM - KNOWLEDGE - ENTERTAINMENT

www.malkakulu.com



DEC
01
2013

0

# කනෙන් රෝද පුටුවක් හැසිරවිය හැකි නව මෙවලමක්!

මේ නව මෙවලම අලුත් ම තාලේ චිපයක්. එයට පුළුවන්, භාවිත කොට ආබාධිත පුද්ගලයන්ට ඔවුන්ගේ කන්වලින් හසුරුවා ගෙන රෝද පුටුවෙන් ගමන් බිමන් යා හැකියි.

ආබාධිතයන්ට මේ චිප සවි කළා ම ඒ චිප මගින් මිනිස් කනෙහි මාංශ පේශීවල චලනයන් නිසා ඇති වන ස්පන්දන හඳුනා ගන්නවා. මේ අති සියුම් සම්ප්‍රේෂණයන් සංඥා බවට පත් කොට රෝද පුටුවේ ඇති එය ක්‍රියා කරවන පරිගණකයට යවනවා. පරිගණකය එය හඳුනා ගෙන ඒ අනුව රෝද පුටුව අවශ්‍ය තැනට ගෙනි යනවා.

ඉහළ පෙළේ ජර්මන් විශ්ව විද්‍යාල තුනකින් ආ පර්යේෂණ කණ්ඩායමෙහි නායකත්වය දැරුවේ ඩේවිඩ් ලයිබෙටන්ස් (David Liebetanz) නම් විද්‍යාඥයායි. ”මේ ක්‍රමයට තමන්ගේ රෝද පුටුව දෙස බලන්නවත් ඊට කතා කරන්නවත් අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබේ හුස්ම ගැනීම අනුව හෝ කනේ චලනය අනුව එය ඉබේම හැසිර වෙනවා.” ඔහු කියනවා.



ජර්මන් විශ්ව විද්‍යාල තුනක විද්‍යාඥයන් එක්වෙලා නවතම චිපයක් නිර්මාණය කරල තියෙනවා, කෙනකුගේ කනේ පේශීවල චලනයන්ගෙන් රෝද පුටුවක් හැසිරවිය හැකි.

ඒ අත්දැකීම ගැන ලයිබෙටන්ස් කීවේ මෙහෙමයි: ”මේ නව නිපැයුම අත්හදා බලන්න දහ දෙනෙක් ස්වේච්ඡාවෙන් යොදා ගනු ලැබුවා. ඔවුන් දින පහක් තිස්සේ ඉගෙන ගත්තා මෙය හසුරුවන හැටි. කන අසල පේශියේ පුංචි චලනයක් තේරුම් ගන්න මේ චිපයට පුළුවන්. ඒත් මේ චලනය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙන හින්දා චිපයට ඒ පුද්ගලයාව හුරු කර වීම අවශ්‍යයි. ඒ වගේ ම කනේ පේශිය චලනය කරන හැටිත් ඒ පුද්ගලයා ඉගෙන ගන්න ඕනෑ.

”දින පහකට පස්සේ ඒ අය පස් දෙනාටම දක්ෂ ලෙස තම තමන්ගේ රෝද පුටු හසුරුවන්න හැකි වුණා. ඔවුන් ජර්මනියේ ගොටින්ජන් රෝහලේ ප්‍රධාන ගොඩනැගිල්ල ඇතුළේ කරදරයක් නැතිව එහා මෙහා ගියා. ඔවුන් තමන්ට අවශ්‍ය විධියට කන හසුරුවන්න ඉගෙන ගත්තා.” ඔහු වැඩිදුරටත් පැහැදිලි කළා.

මනෝවිද්‍යාඥ ලියෝනි ෂිමැල්ෆස් (Leonie Schmalfuss) මේ ගැන කීවේ, ”කනේ මාංශ පේශිය සෙලවීම ඉතාමත් කෙටිකාලයකින් ඕනෑම කෙනකුට පහසුවෙන් ඉගෙන ගන්න පුළුවන් දෙයක්.” කියායි.

”ඒත් අපේ අත්හදා බැලීමට උදවුවෙන්න ආ අය අතරින් බාගයක් විතර ආපු ගමන් ම කීවේ තමන්ට කන සොලවන්න බැරි බවයි. ඒත් අවසානයේ දී හැමෝටම ඒක කරන්න පුළුවන් වුණා. අපි බලාපොරොත්තු

WWW.SURASA.LK




මල් කැකුළු කර්තෘ අයිතිය

‘මල් කැකුළු’ Creative Commons බලපත්‍රය යටතේ කර්තෘ අයිතිය සුරක්ෂිත කර ඇත. උපුටා ගැනීමකදී අදාල ලිපියේ සබැඳිය (Link) හෝ මල් කැකුළු අඩවියේ නම සඳහන් කිරීමට කාරුණික වන්න.

PROTECTED BY COPYSCAPE DO NOT COPY

www.malkakulu.com is licensed under Creative Commons.

කියවන්න බැරිනම් සිංහල ගන්න


විශේෂ නිවේදනයයි !

‘මල් කැකුළු’ තුලින් පලකරන ලිපි අන්තර්ජාල පුවත් සේවා, රූපවාහිනි වැඩසටහන්, සඟරා, පොත් පත්

වුණාටත් වැඩිය වැඩේ සාර්ථක වුණා.” ලයිබෙටන්ස් කියනවා.

ඔහු අවසාන වශයෙන් කියන්නේ, ”මේ නව නිපැයුම විශේෂයෙන් ම තනා ඇත්තේ කොඳු ඇට පේළියේ, එනම් කශේරුවේ ආබාධයන් නිසා තමන්ගේ අත්පා චලනය කළ නොහැකි ඉණෙන් පහළ පණ නැති වූ අයටයි.” කියලයි.



මේ නිමැවුම විශේෂයෙන් ඉලක්ක කරගෙන තියෙන්නේ කශේරුවේ ආබාධයන් නිසා තමන්ගේ අත්පා චලනය කළ නොහැකි ඉණෙන් පහළ පණ නැති වූ අයටයි.



මේ නව මෙවලමේ සාර්ථකත්වය මනින්න කළ අත්හදා බැලීම සඳහා දහ දෙනකු සහභාගි කරවා ගත්තා. ඔවුන් දින පහක් තිස්සේ ජර්මනියේ ගොටින්ජන් රෝහලේ දී මෙය පැදවීම පුහුණු වුණා.

මේ නව තාක්ෂණය නිසා කශේරුව තුවාල වීමෙන් රෝද පුටුවට වැටුණු අයට එහා මෙහා යන පහසුවෙන් කළ හැකි වේවි.

**Facebook සමග එක්වන්න. මේ ලිපිය වෙන අය සමගත් බෙදා ගන්න.**

සහ අපගේ අත්දැකීම් ඇසුරින් අප විසින් තොරතුරු එක් රැස්කර සකසන ලිපි වේ. ළමයින් විශේෂයෙන් ඉලක්ක කර ගත්තද මෙහි එන දැනුම සියලූ වයස්වල පාඨකයන්ට එකසේ ආස්වාදජනක ලෙස ඉදිරිපත් කිරීමට හැම විට ම අපි අපේක්ෂා කරමු.

**අප සමග එක්වන්න**

**මල් කැකුළු ජනප්‍රිය ලිපි**































**පරණ ලිපි බලන්න**

▼ 2013 (201)

නව නිපැයුම්

**0 අදහස්:**

**POST A COMMENT**

Subscribe to: Post Comments (Atom)


▼ December (3)

- මේ සියවසේ විසූ මහා විශ්ව පුරුෂයාගේ නික්ම යාම! නෙල්...
- සත්ව ලෝකයේ අලුත් ම සොයා ගැනීමක්! සත්වයෙක්ද? ශාකයක්...
- කනෙන් රෝද පුටුවක් හැසිරවිය හැකි නව මෙවලමක්!

► November (9)
► October (11)
► September (9)
► August (11)
► July (17)
► June (9)
► May (24)
► April (22)
► March (25)
► February (29)
► January (32)

► 2012 (441)
► 2011 (131)


**වර්ගීකරණය**


අන්දරේගේ කතා
අපේ ඇත්තෝ
අපේ රටේ නගර
අලුත් සොයා ගැනීම්
අහඹු සිදුවීම්
ආසියානු සිනමාව
ඉලක්කම් සෙල්ලම්
කතන්දර
කැලෑන්ඩරේ කතන්දරේ
ගණිත විනෝදය
ගවේෂණ
ජන කතා
දැන මුතු
දිව ඔසු
දුක දිනා ජයගත් හපන්නු
නව කවිසරණිය
නව නිපැයුම්
නව පර්යේෂණ
නස්රුදින්ගේ කතා
නිදහසට පෙර දේශපාලන රස කතා
පරිණාමයේ කතාව
පාඨක නිර්මාණ
පුංචි හිතට නැගුණු ගැටලු
පුනර්ජනනී වෛද්‍ය විද්‍යාව
පුරාණ පිටසක්වළ ජීවීන්ගේ කතාව
පුරාණ ශිෂ්ටාචාර
පොත්
පොත් ගැන
බසක හැටි
බුදුන් දුන් ඔවදන්
බොදු උපමා කතා
ලොව මවිත කළ වීර කතා

අපිව බලපු අය

අපිව බලපු ගණන

.: මල් කැකුළු 2011 - 2013 : Sri Lankan Kids :.
All rights reserved www.malkakulu.com